# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2134/46 – 2019 අගෝස්තු 01 වැනි බ්‍රහස්පතින්දා – 2019.08.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

39අ(1) වැනි වගන්තිය යටතේ නියමය

2006 මාර්තු මස 02 වැනි දින අංක 1434/26 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයෙහි* (460 වැනි අධිකාරිය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළකරන ලද 2006 අංක 77 දරන ආඥාවේ සඳහන් කැබලි අංක 24 ඉඩම් කොටස සම්පූර්ණයෙන් ම රජය සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටසේ සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39අ(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, එකී ඉඩම් කොටස් අතුරින් මෙහි පහත I වන උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: එල්ඩී/05/2003/NH/596.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: MOR/LAN/LU/DIV-04.
2019 ජූලි මස 25 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
මිහිකත මැදුර,
අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

I වන උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ලක්ෂපතිය උතුර 550ඒ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ලක්ෂපතිය ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක 520210, කලාප 08 පත්‍ර අංක 01 හා 2009.07.29 දිනැති කැඩැස්තර සිතියමේ හෙක්. 0.0112ක් වන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් හා මායිම්වලින් යුක්ත ඉඩම් කොටස:

01. **කැබලි අංක 51 – කුට්ටේරියවල – ප්‍රමාණය: හෙක්. 0.0112**
උතුරට: කැබලි අංක 52 දරන එළි ඇළ සහ කැබලි අංක 97 දරන පාර; නැගෙනහිරට: කැබලි අංක 50; දකුණට: කැබලි අංක 46 සහ 47; බටහිරට: කැබලි අංක 52 දරන එළි ඇළ.

08 - 596

---

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

39අ(1) වැනි වගන්තිය යටතේ නියමය

2018 අගෝස්තු මස 30 වැනි දින අංක 2086/21 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයෙහි* (460 වැනි අධිකාරිය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළකරන ලද 2018 අංක 207 හා 2018.08.09 වැනි දින දරන ආඥාවේ සඳහන් ඉඩම් කොටස රජය වෙත සම්පූර්ණයෙන් ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය

යටතේ එම ඉඩම් කොටසේ සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39අ(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, පහත උපලේඛනයේ සඳහන් අංක MR/DKW/2018/238 හා 2018.06.25 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සඳහන් සම්පූර්ණ ඉඩම මෙම නියමය මගින් අවසතු කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/15/2018/VE/39.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: DIK/LAN/02/65.
2019 ජූලි මස 18 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
මිහිකත මැදුර,
අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

## I වන උපලේඛනය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැල්ලබඩපත්තුව සුළු කොට්ඨාසයේ, ඌරුගමුව ගමේ පිහිටි මැනුම්පති විසින් පිළියෙල කරන ලද අංක MR/DKW/2018/238 හා 2018.06.25 දිනැති ප්‍රගමන අනුරේඛනයේ දක්වා ඇති නමින් හා ප්‍රමාණයෙන් යුක්ත වූ ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – පැනිවැල්හේන්යාය – ප්‍රමාණය: හෙක්. 1.0105**

උතුරට: එන්. ටී. සීතා හිමිකම් කියන පොල්අඹේකොරටුව, එන්. එච්. ලක්ෂිකා හිමිකම් කියන උඩවත්ත සහ මල්ලිකා පරණමාන හිමිකම් කියන උඩවත්ත; නැගෙනහිරට: එන්. ටී. සීතා හිමිකම් කියන පොල්අඹේකොරටුව, එන්. එච්. ලක්ෂිකා හිමිකම් කියන උඩවත්ත, මල්ලිකා පරණමාන හිමිකම් කියන උඩවත්ත, ඉන්දික හිමිකම් කියන පරණවත්ත සහ ජිනදාස පරණමාන හිමිකම් කියන කැටකාලගහවත්ත; දකුණට: ඉන්දික හිමිකම් කියන පරණවත්ත සහ ජිනදාස පරණමාන හිමිකම් කියන කැටකාලගහවත්ත, හිමිකරු සොයාගත නොහැකි කැටකාලගහවත්ත සහ මාර්ගය (ප්‍රාදේශීය සභා); බටහිරට: මාර්ගය (ප්‍රාදේශීය සභා).

08 - 597

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.